# සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව - දකුණු පළාත
சுகாதார சேவைத் திணைக்களம் - தென் மாகாணம்
Department of Health Services - Southern Province

අංක 15 ඒ, පහළ ඩික්සන් පාර, ගාල්ල. ශ්‍රී ලංකාව.
15ஏ, கீழ் டிக்ஸன் பாதை, காலி. ஸ்ரீ லங்கா.
No. 15A, Lower Dickson Rd, Galle. Sri Lanka.

E-mail : pdhssp@yahoo.com
Web : www.healthdept.sp.gov.lk
Skype : Pdhs.sp


මගේ අංකය / My No. SPH/EST/ED/04/04/2022 ඔබේ අංකය / Your No. දිනය / Date 2022.09. 06

දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,
ගාල්ල /මාතර/ හම්බන්තොට.

අදාල ආයතන ප්‍රධානින්,

**<u>වාර්ෂික ස්ථාන මාරු අභියාචනා මණ්ඩල තීරණ 2022 –</u>**
**<u>වෘත්තීය චිකිත්සක</u>**

2022 වාර්ෂික ස්ථාන මාරුවීම් යටතේ දකුණු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ස්ථාන මාරු මණ්ඩලයේ නිර්දේශ මත, මගේ සමාංක හා 2022.03.16 දිනැති ලිපිය මඟින් නියෝග කරන ලද 2022 වාර්ෂික ස්ථාන මාරුවීම් 2023.01.01 දින සිට ක්‍රියාත්මක වන අතර, ඒ සම්බන්ධව ඉදිරිපත් කර ඇති පහත නම් සඳහන් වෘත්තීය චිකිත්සක නිලධාරින්ගේ අභියාචනා සම්බන්ධයෙන් පහත පරිදි ක්‍රියා කරන ලෙසද වැඩිදුරටත් දන්වා සිටිමි.

| අනු අංකය | ස්ථාන මාරු නියෝග අංකය | නිලධාරියාගේ නම | වර්තමාන සේවා ස්ථානය | නියෝග කරනු ලබන ස්ථානය | අභියාචනා මණ්ඩල තිරණ |
|---|---|---|---|---|---|
| 1 | 1 | එච්.ඩී.එස්. හසන්ති මිය | දිසා රෝහල, උණවටුන | මූලික රෝහල, කඹුරුපිටිය | උණවටුන රෝහලට අනුප්‍රාප්තිකයෙක් ලද පසු ස්ථාන මාරුව ක්‍රියාත්මකයි. |

02. තවද, 2022 වර්ෂයට අදාලව නියම කරන ලද වාර්ෂික ස්ථාන මාරු පිළිබඳව දකුණු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙහි (www.healthdept.sp.gov.lk) ප්‍රසිද්ධ කර ඇති අතර අදාල <u>ආයතන ප්‍රධානින් විසින් මෙම මාරුවීම් නියෝග වලට ඇතුලත් වන නිලධාරීන් ස්ථාන මාරු නියෝග පිළිබඳව දැනුවත් කිරීම සිදු කල යුතුය.</u>

03. ඔබ සේවා ස්ථානයේ ස්ථාන මාරු නියෝග ලබා ඇති නිලධාරීන් 2022.12.31 දින සේවයෙන් පසු 2023.01.01 දින නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගැනීමට හැකි වන පරිදි ඔබ කාර්යාලයෙන් නිදහස් කිරීමට කටයුතු කරන ලෙසත්, <u>අනුප්‍රාප්තික නිලධාරින් පැමිණෙන තෙක් ඔවුන් රඳවා නොගන්නා ලෙසත්</u>, දන්වන අතර ස්ථාන මාරු වී යන නිලධාරින්ගේ රාජකාරි වෙනත් නිලධාරියකුහට භාර දී ඔවුන් නිදහස් කිරීමට ආයතන ප්‍රධානින් කටයුතු කල යුතු බවත් වැඩිදුරටත් දන්වමි.

04. තවද, අනුප්‍රාප්තිකයකු ලද පසු පමණක් සඳහන් ස්ථාන මාරු ක්‍රියාත්මක විය යුත්තේ අදාල අනුප්‍රාප්තිකයන් සේවයට වාර්තා කල පසු බව වැඩිදුරටත් දන්වා සිටිමි.

දකුණු පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ

විශේෂඥ වෛද්‍ය චන්දිම සිරිතුංග
එම්.බී.බී.එස්, එම්.එස්.සී.එම්.ඩී.(ප්‍රජා වෛද්‍ය
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ
දකුණු පළාත

පිටපත්:
01. ලේකම්, ප්‍රධාන අමාත්‍යාංශය,දකුණු පළාත. - කාරු.දැ.ගැ.ස.
02. අදාල වෘත්තිය සමිති - දැ.ගැ.ස.